

# ගාල්ලට මුහුණලා ඇති 'ගෝල් ෆේස්'

**තුෂාරා සෙව්වන්දි**

විවිධ වයස් කාණ්ඩවල, විවිධ සමාජ මට්ටම්වල මෙන්ම විවිධ ජාතීන්ට අයත්වන බොහෝ දෙනාට විඩාව නිවන්නට, කෙළිදෙළෙන් හැසිරෙන්නට, මිත්‍ර සන්ධවයන් පවත්වන්නට ද දොඩමලුවන ප්‍රේමවන්තයින්ටද ගාලු මුවදොර පිටිය තෝතැන්නක් බවට පත් වී ඇත.

අද කුඩා බිම් තීරුවකට සීමා වූවද යටත්විජිත සමයේදී කොළඹ කොටුවේ දකුණු ගේට්ටුවේ සිට ගල්කිස්ස දක්වා ම තිබු තැනිතලා ප්‍රදේශය ගාලු මුව දොර වශයෙන් හඳුන්වා ඇත.

ගාලු මුවදොර හෙවත් 'ගෝල් ෆේස්' යන නාමය ලැබී ඇත්තේ 'ගෝල් ෆාස්' (Galle Fass) යන ඕලන්ද යෙදුම නිසා බවත් එහි අර්ථය වන්නේ ගාල්ල දෙසට මුහුණ ලා ඇති ප්‍රකාර බැම්ම යන්නයි.

එබැවින් ගාල්ල දෙයට මුහුණලා ඇති හෙයින් ගාලු මුවදොර වශයෙනුත් ඉංග්‍රීයෙන් 'ගෝල් ෆේස්' (Galle Face) යනුවෙන් හඳුන්වන්නට ඇති බව ඉතිහාසඥයකු වන ආචාර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා පෙන්වා දී ඇත.

යටත් විජිත සමයේදී, වැරදි කරුවන් එල්ලා මරණ වධක භූමියක් ලෙස ද විටෙක සුසාන භූමියක් ලෙසද භාවිතා කළ මෙම භූමි භාගය 1828 දී මෙරට සිටි ආණ්ඩුකාරවරයා වූ එඩ්වඩ් බාන්ස් විසින් තුරංග තරංග පිටියක් ලෙස යොදා ගෙන ඇත.

පසු කාලයක දී ගෝල් ෆෙස් පිටිය ගෝල්ෆ් ක්‍රීඩාව සඳහාද යොදා ගෙන ඇත.
1856 දී මෙරට ආණ්ඩුකාරවරයකු වූ ශ්‍රීමත් හෙන්රි වෝඩ් විසින් ගාලු මුව දොර පිටිය කොළඹ වෙසෙන ළමුන්, කාන්තාවන් ඇතුළු ජනයාගේ විවේකය පිණිස වෙන් කරන බවත් එය ඉදිරි පාලකයන්ගේ අනුග්‍රහය යටතේ පවත්වා ගෙන යායුතු බවත් එලකයක ලියා ප්‍රකාශයට පත් කරනු ලැබිය.

එතැන් පටන් බොහෝ ජනයා මෙම බිම් තිරුවේ නිදහසේ කාලය ගත කිරීමටත් තෙරක් නොපෙනෙන සයුරේ අශ්වාදය විඳින්නට පැමිණෙති.

එදා සිට අද දක්වා ගාලු මුවදොර හා බැඳුණු සංස්කෘතිය පරිණාමයට ලක්වී තිබුණත්, එතෙක් මෙතෙක් මිනිසුන් ගාලු මුවදොර හා ආදරයෙන් බැඳුණු හේතුවනම් වෙනස් වී නොමැත.

**8 වන පිටෙන්**

යන්න අපැහැදිලිය. මහින්ද රාජපක්ෂට නැවත රට බාරදීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවා ඇත්තේ මෛත්‍රීපාල නායකත්වය දරන ඒ සන්ධානයේම හවුල්කාර සුළු පක්ෂ කීපයකි.

හවුලේ මහ පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරයක් සහාය දක්වන්නේද ඒ වැඩස-ටහනටය. ඒ අතර ඉදිරි මැතිවරණයේදී මේ සියල්ල නැවත එක පිලකට ගොණුවී ජනාධිපතිවරයා නායකත්වය දෙන සන්ධානයක් ලෙස තරංගයට ඒමට සැළසුම් සකස් වෙමින් පවතී. පසුගිය දිනවල ජනාධිපතිවරයාද පවසා තිබුණේ සන්ධානයේ "සියලු කුණු කසළ" නැවත එක ගොඩකට එක්කර ගනිමින් ඉදිරි මැතිවරණයට මුහුණ දී එය ජයගත යුතු බවය. ඔහු සන්ධානය තුළ සිදුකරමින් සිටින ප්‍රතිසංස්කරණ දෙස බැලූ විටද ඒ බව පෙනී යයි. ඒ ආකාරයෙන් කටයුතු සිදුවුව හොත් නොබෝ කලකින්ම නැවතත් ඇතිවන්නේ ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් එකම පක්ෂයක් නියෝජනය කරන තත්ත්වයකි. 19 වෙනි සංශෝධනයෙන් පවා ජනාධිපති ධූරය සම්බන්ධයෙන් කේන්ද්‍රිය වෙනස්කම් සිදුව නොමැති තත්ත්වයක් තුළ ඒ ආණ්ඩුව සමාන වනු ඇත්තේ ඉකුත් ජනවාරි 08 වෙනිදාට පෙර පැවැති ආණ්ඩුවටමය. එකම වෙනස වනු ඇත්තේ එහි නායකත්වය මහින්දගෙන් මෛත්‍රීට මාරුවී තිබීම පමණි. යම් ආකා-ාරයකින් මහින්ද රාජපක්ෂ ඉදිරි මැතිවරණයට ඉදිරිපත්ව ජයගත හොත් පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක විශ්වාසය හිමිකරගනිමින් අගමැති ධූරයට වුවද පත්විය හැකිය. මේ තත්ත්වය රටට ඉතාමත් අහිතකර ප්‍රතිපල අත්කර දීමට හේතුවිය හැකිය.

අනෙක් අතට ජනවාරි 08 වෙනි දින හැට දෙලක්ෂයකට වැඩි ජනතාවක් විපක්ෂයේ පොදු අපේක්ෂකයාට ඡන්දය දුන්නේ මහින්ද රාජපක්ෂ වෙනුවට මෛත්‍රීපාල සිරිසේන ආදේශ කිරීමට නොවේ. රටේ බලවත් දේශපාලන ප්‍රතිසංස්කරණ වැඩසටහනකට මුල පිරීමටය. කටයුතු සිදුවෙමින් පවතින්නේ ඊට ප්‍රතිවිරුද්ධවය. විප්ලවය පරාජය කොට හිස ඔසවමින් තිබෙන්නේ ප්‍රති විප්ලවය ය.
එබැවින් ඉදිරි මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මූලිකව ගොඩනැගෙන කවර හෝ සන්ධානයක් කොන්දේසි විරහිතව, අනිවාර්යෙන්ම පරාජයට පත්කළ යුතුය. එම සන්ධානය කවර ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළද එය විමසා බැලීමකින් පවා තොරව ඉවත දැමිය යුතුය. දේශපාලන තක්කඩියන් සහ වංචනික අවස්ථාවාදීන් සමූහයක් වෙත නැවත නැවතත් විශ්වාසය තැබීම කිසි ලෙසකි න්වත් නොකළ යුතුමය.
එබැවින් ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ පරාජය කළාක් මෙන්ම ජනතාව එක පෙළට පෙළ ගැසී ඉදිරි මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයද කොන්දේසි විරහිතව පරාජය කළ යුතුමය. අන් කවර දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් බලයට පත්කර ගත්තද සන්ධානය බලයට පත්කරගැනීමකින් සිදුවන හානිය සිදුනොවනු ඇත. අනෙක් අතට අලුත් පාර්ලිමේන්තුවක් පත්කොට ගැනීමෙන් ජනවාරි 08 ජනවරම දෙසට තවත් පියවරක් දෙකක් තැබීමට යළිත් අවකාශයක් නිර්මාණය නිර්මාණය කරගත හැකිවනු ඇත.

# දුක තමයි රංජනී!




ඉහත දැක්වෙන "දුක තමයි රංජනී!" යන යෙදුම තත්කාලීන ලාංකික සිංහල ජනවහරේ භාවිතා වෙන්නකි. මෙහි මූලාශ්‍රය හෝ නිරුක්තිය මා හරි හැටි නොදනිතත්, බොහෝ විට මෙය ජනප්‍රිය ටෙලි නාට්‍යයක චරිතයක් නිතරම කියූ වදන් පෙලක් වෙන්නට ඉඩ තිබේ. මා අසා ඇති පරිදි මෙහි පිළිතුරු පදවැල වෙන්නේ "අනේ මන්ද සරත්!" යන්නයි.
දශකයකටත් වඩා කාලයක් මා වාසය කළ අපේ ගම් පලාතේ කලාකාමී පිරිසක් එක් වී පිහිටුවා ගත් මහා කලා කවයක් විය. මේ ස්වේච්ඡා සංගමය මගින් දිගු කාලයක් තිස්සේ ප්‍රදේශයේ සංස්කෘතිය වෙනුවෙන් කළ වැඩ කටයුතු රාශියක් වේ. කලා කවයේ සාමාජිකයෝ ද, පොදුවේ සිංහල සාහිත්‍යයට, නර්තන, රංගන, ගායන, වාදන කලාවන්ට තම හැකි අයුරින් සේවය කළෝය.

මේ කලා කවයෙන් දැන් වසර කිහිපයක කලින් ඉතා වැදගත් අළුත් ව්‍යාපෘතියක් ඇරඹිණි. එය නම්, වසර අවසානයේ පවත්වන කලා කවයේ සාමාජික සාදයේ දී, ඒ වසරේ පොත් පත් ලියූ, ගී තැටි බිහි කළ, නාට්‍ය වේදිකාගත කිරීම සහ වෙනත් විවිධ කලා කටයුතු කළ අයව තවත් දිරි ගන්වනු පිණිස සහ ඔවුන් ගේ සේවය අගය කරනු පිණිස සමරු ඵලකයක් ප්‍රධානය කිරීමයි. මේ වැඩ පිළිවෙල අරඹා දෙවන වසර අවසානයේ දී පැවැත්වුණු වාර්ශික සාදයේ දී, මේ ආකාරයේ ඵලකයක් මට ද ලැබුණි. ඒ මා එක්තරා පොතක් ලියා පල කිරීම අගැයීම පිණිස ය. හොඳ වේලාවට මේ සම්මාන ප්‍රදානයේ දී අගැයීමට ලක් කෙරෙන්නේ කලා කවයේ සාමාජිකයෙකු ගේ පොතක් ලියා පළ කිරීමේ කර්තව්‍යය පමණි. පොතේ ඇති වැදගත්කම ගැන සැලකිල්ලක් නොදැ-ක්වේ!



වසරක් ගෙවී තවත් වසරක අවසානය එළැඹිණි.
කුමන හෝ හේතුවක් නිසා ඒ වසරේ දී පැවති සාමාජික සාදයේ දී මේ සාමාජික කෘති අගැයීමේ අංගය දක්නට නොලැබිණි.

තවත් මාස ගණනකට පසුව අපේ කලා කවයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විණි. එහි දී, වසරේ ප්‍රගති වාර්තා ඉදිරිපත් කළායින් පසුව එළැඹෙන සාකච්ඡා වාරයේ දී, මා මේ පිළිබඳව ප්‍රශ්නයක් ගෙවී යන වසරේ කලා කවයේ නායකත්වය දැරූ සහෘදයාට යොමු කළෙමි.

"පසුගිය වසර තුළ දී අපේ සාමාජිකයින් විසින් එළිදක්වනු ලැබූ කලා කෘති අගැයීම පසුගිය වාර්ෂික සාදයේ දී නොකළේ ඇයි?"˜ ඒ මා ඇසු සරල ප්‍රශ්නයයි.
ඒ ඇගැයීමේ ක්‍රියාවලිය, කලා කවය විසින් අතහැර දමා නැති බවත්, සිදු කෙරුණේ කල් දැමීමත් පමණක් බවත්, නුදුරු දිනයක දී පැවත්වෙන වාර්ෂික සුහද සාදයේ දී ගිය වසරේ සහ මේ වසරේ කලා කෘති සඳහා ඇගයීම් උත්සව දෙකම එකට පවත්වන බවත් මට පිළිතුර ලෙස ලැබුණි.

"ඒ වගකීම මම පුද්ගලිකව බාර ගන්නවා!" තම සේවා කාලය නිමවන සභාපති වැඩිදුරටත් පැවසීය.

මේ කර්තව්‍යය ඒ වන විට පුරා අවුරුද්දක් ම ප්‍රමාද වී ඇත්තේ වුවද, "බෙටර් ලේට් දෑන් නෙවර්!" යැයි කියවෙන කියමනට ද අනුව, සභාපති ගෙන් මට ලැබුණු ඒ පිළිතුර සතුටුදයක පිළිතුරක් විය.

ඒ රැස්වීමෙන් ටික දිනකට පසු මට දුරකතන ඇමතුමක් ලැබුණි. ඒ හිටපු සභාපති ගෙනි.
"රසික, මේ පාර පැවැත්වෙන වාර්ෂික සාදයේ දී, අර කලාකෘති ඇගයීමේ අංගයට ගිය වසරේ නම් ලයිස්තුව හදන්නට බාර වෙලා තියෙන්නේ මටයි. මට කියන්නකෝ ඔහේ ලියපු පොත ගැන විස්තර?"˜ හිටපු සභාපති මගෙන් ඉල්ලීමක් කළේය.¯¯

"මොන පොත ද? මං ලියපු එකම පොත ලියලා දැන් අවුරුදු දෙකකටත් වැඩියි නේ! ඒක මීට අවුරුදු දෙකකට කලින් තියපු උත්සවයේ දී පැවැත්වුණු ඇගයීමට අයිති වුණා නේ!"˜ මම පැවසුවෙමි.¯

"මං හිතුවේ රසික ගිය අවුරුද්දේ අළුත් පොතක් ලිව්වාය කියලයි."˜

"ඇයි හිටපු සභාපති ඔයා එහෙම හිතුවේ? මං අළුතින් පොතක් ලිව්වා නං ඔබට පිටපතක් නොදී ඉන්නේ නෑ නොවැ?"˜

"නෑ ඉතිං, රසික එද අර රැස්වීමේ දී මේ කලාකෘති ඇගයීම ගිය අවුරුද්දේ නොපැවැත්වීම ගැන ප්‍රශ්න කළා නේ, ඒකයි මං හිතුවේ රසිකත් පොතක් ලියලා ය කියලා!"˜¯

මට ඇතිවුණු හැඟීම විස්තර කළ යුතු හොඳම ක්‍රමය මෙලෙස වේ.

දුක තමයි රංජනී!

"අනේ හිටපු සභාපති, මට ලැබෙන්න තිබුණු දෙයක් නොලැබුණු හින්ද නොවෙයි, මට ලැබිලා, අනෙක් අයට නොලැබුණු හින්දයි මං ඒ ප්‍රශ්න කෙරුවේ!"˜

"ආ, ඇත්තද?"˜

ඒ දුරකතන කතාබහ එතැනින්ම අවසාන විය. මේ සිද්ධිය අනුසාරයෙන් අපට කතාබහ කළ හැකි ප්‍රධානම කරුණ නම් මෙයයි.

අප බොහො දෙනෙක් සිතනුයේ, තමන් වගේ ම අන් අයත් යම් හඬක් නගන්නේ තමන් ගේ වාසියට පමණක්ය කියායි. තමන්ට නොව, අනුන්ට වෙන අසාධාරණකම් ගැන කතා කරන අයත් සිටිනා බව එවැන්නෝ නොදනිති.

කරුණු එසේ හෙයින්, තමන් ට අවාසියක් වුණත් අනුන් ගේ අයිතීන් වෙනුවෙන් කතා කරන අය ඉන්නා බවත්, ඒ එක්කම, තමන් ගේ මතය ඊට හාත්පසින් ම වෙනස් වුනත් වෙනත් අයට ඔවුන් ගේ මත දැරීමට ඇති අයිතිය වෙනුවෙන් කතා කරන අය ඉන්නා බවත් දැන ගැනීම, ඒ පිරිසට සිහිය විකල්වෙන තත්වයක් වෙනු ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ යැයි සිතමි.